## ස.තො.ස. ආර්ථික මධ්‍යස්ථාන සේවා (පෞද්ගලික) සමාගම - 2015/2016

---

ස.තො.ස. ආර්ථික මධ්‍යස්ථාන සේවා (පෞද්ගලික) සමාගමේ (" සමාගම") 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක සහය යටතේ මෙම විගණනය සිදුකර කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (සු.ම.ව. සඳහා ශ්‍රී.ල.මූ.ප්‍ර.) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශන වලින් 2016 මාර්තු 31 දිනට ස.තො.ස. ආර්ථික මධ්‍යස්ථාන සේවා (පෞද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (සු.ම.ව. සඳහා ශ්‍රී.ල.මූ.ප්‍ර.) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 අනෙකුත් නීති හා රෙගුලාසි පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2007 අංක 07 දරණ සමාගම් පනතේ, 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මතය සඳහා පදනම සහ විගණනයේ විෂය පථය හා සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මාගේ මතය :

- මා විසින්, විගණනය සඳහා අවශ්‍ය වන හා මාගේ පරීක්ෂණ වලට අනුව අවශ්‍ය යැයි හැඟෙන සියළුම විගණන සාක්ෂි හා පැහැදිලි කිරීම් ලබා ගෙන ඇති අතර, සමාගම විසින් ක්‍රමානුකූලව ගිණුම් වාර්තා පවත්වා ගෙන ඇත.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියෙහි දක්වා ඇති අවශ්‍යතා වලට අනුකූල වේ.

### 2.1.2 සමාගම සංස්ථාපනය කිරීම

--------------------------------

සමාගම සංස්ථාපනය කිරීම සම්බන්ධයෙන් වූ පාර්ලිමේන්තු අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------------

### 2.2.1 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූල වීම් (සු.ම.ව. සඳහා ශ්‍රී.ල.මූ.ප්‍ර.) – 28 වන වගන්තිය

---------------------------------------------------------------------------------------------------------------

පාරිතෝෂික දීමනා සම්බන්ධ වෙන්කිරීම් ගණනය කිරීමේදී, සමාගම විසින් විශ්‍රාම ගන්නා අවස්ථාවේදී පාරිතෝෂික දීමනා ලබා ගැනීමට සුදුසුකම් ඇති සියළුම නිළධාරීන් සැලකිල්ලට ගෙන නොතිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් අයිතම සම්බන්ධයෙන් වූ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

| අයිතම | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) ඉකුත් වර්ෂයේ ගැළපීම් | 2,031,740 | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය |
| (ආ) බදු කුලී වියදම් | 1,476,842 | බදු කුලී ගිවිසුම |
| (ඇ) බදු කුලී අත්තිකාරම් ලැබීම්, ආපසු ගෙවිය යුතු ඇප තැන්පත් සහ පරිගණක උපාංග හා සනීපාරක්ෂක සේවා සඳහා ගෙවිය යුතු මුදල් | 1,529,971 | විස්තරාත්මක තොරතුරු හා කාල විශ්ලේෂණ |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

අවුරුදු 2 ක සිට අයකර ගෙන නොතිබූ භාර අරමුදල් 5 කින් හා වෙළඳ ණයගැතියන්ගෙන් සමන්විත එකතුව පිළිවෙලින් රු. 1,076,539 ක් හා රු. 3,982,956 ක් 2016 මාර්තු 31 දිනට අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

### 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2016 අංක 22 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනත | සමාලෝචිත වර්ෂයට අදාල රු. 252,138 ක වටිනාකමකින් යුතු ජාතිය ගොඩනැගීමේ බදු නියමිත කාලපරිච්ඡේදය ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා නොතිබුණි. |
| (ආ) 2014 අංක 07 දරණ එකතු කල අගය මත බදු පනත | රු. 1,414,496 ක වටිනාකමකින් යුතු එකතු කල අගය මත බදු, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට නියම කර තිබුණු කාලය තුල පියවර ගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය කටයුතුවල ප්‍රතිඵලය රු. 2,676,180 ක අතිරික්තයක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු. 7,817,522 ක් වූ අතර, ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,141,342 ක පිරිහීමක් විය. පරිපාලන වියදම් රු. 4,966,898 කින් ඉහළයාම මූල්‍ය ප්‍රතිඵලයන්හි පිරිහීම සඳහා ප්‍රධාන ලෙස හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 3 ක මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේදී, 2013 වර්ෂයේ පැවති රු. 6,215,839 ක් වූ අතිරික්තය 2016 වර්ෂයේදී රු. 2,676,180 ක් දක්වා උච්චාවචන සහිතව අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සේවක වේතන, ක්ෂයවීම් හා බදු සැලකිල්ලට ගැනීමෙන් පසු සමාගමේ රු. 158,571,655 ක අගය එකතුවීමක් විය. කෙසේ නමුත් ඉකුත් වර්ෂයේදී එම අගය රු. 164,534,897 ක් විය.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

### 4.1 සංයුක්ත සැළැස්ම

----------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව සමාගම විසින් 2011 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.2 ක්‍රියාකාරි සැළැස්ම

----------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එමනිසා විගණනයේදී සමාගමේ කාර්යසාධනය අගය කිරීමට නොහැකිවුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

-------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.4 විගණන කමිටු

------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන කමිටු ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර සමාගමේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) වත්කම් කළමණාකරණය | භාණ්ඩ සමීක්ෂණය /වත්කම් සත්‍යාපනය සිදුකිරීමට අපොහොසත් වීම. |
| (ආ) ගිණුම්කරණය | ව්‍යවස්ථාපිත ගෙවීම් පියවීමට මුදල් පදනම භාවිතා කිරීම. |
| (ඇ) ආදායම් හා වියදම් පාලනය | වියදම් පාලනය කිරීමට හා ආදායම් ඉහළ නැංවීමට පියවර ගෙන නොතිබීම. |